**ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කල මතය**

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජනවාරි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා** ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ විකුණන ලද දෙපාර්තමේන්තුවට අයත් වාහන 02 ක පිරිවැය වූ රු.1,350,000 ක වටිනාකම දේපල පිරියත උපකරන වටිනාකමින් ඉවත්කර නොතිබුණි. | විකුණන ලද වාහන දේපල පිරියත උපකරණ වටිනාකමින් ඉවත්කල යුතුය. | 2020 වර්ෂයේදී නිවරදි කිරීමට කටයුතු කරන ලදි. |
| (ආ) | 2018 වර්ෂයේදී මිලදීගන්නා ලද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම වූ රු.2,108,000 ක් දේපල පිරියත උපකරණ යටතේ දක්වා නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අදාල ස්ථාවර වත්කම් දේපල පිරියත උපකරණ යටතේ දැක්විය යුතුය. | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තුව සතුව පවතින කටුබැද්දේ ඇති ගොඩනැගිලි සංකීර්ණය සහ තවත් ස්ථාන 12 ක පිහිටා ඇති ගොඩනැගිලි 25 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කල යුතුය. | මේ සම්බන්ධව දිගින් දිගටම තක්සේරු දෙපාර්තමේන්තුවට වාචිකව හා ලිඛිතව දැනුවත් කර ඇති අතර තවමත් තක්සේරු වාර්තා ලබාදී නොමැත. මේ පිළිබඳව විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

## 1.6.2 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ මැයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති අංක එස්ඊ/ඒ/4/34 දරන 1995 ජුලි 21 දිනැති මාර්ගෝපදේශයේ 9 ඡේදය | බදු දෙන ලද ඉඩම්වලට අදාල ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීම, නියමිත කාලයේදී බදු ගිවිසුම අළුත් කිරීම හා නිතිපතා බදු කුලී එකතු කිරීම සිදු වන බවට වගබලා ගැනීම, බදු ගැනුම්කරු විසින් ගිවිසුමෙහි වගන්ති හා කොන්දේසි පිළිපැදීම අධීක්ෂණය හා නිරීක්ෂණය කිරීම සහ ගිවිසුමේ වගන්ති හා කොන්දේසි කඩකළ අවස්ථා වලදී දේපළ පිළිබඳ අයිතිය නැවත ලබා ගැනීම සඳහා නීතිමය පියවර ගැනීම යනාදී කටයුතු ඉටු කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වය යටතේ විශේෂ ඒකකයක් පිහිටුවිය යුතු විය. එහෙත් දෙපාර්තමේන්තුව විසින් බදු දෙනු ලැබූ ජේෂකර්ම බලවේග ව්‍යාපාර සම්බන්ධයෙන් 2015 නොවැම්බර් මස ජේෂතාක්ෂණ විශේෂඥ හා සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුක්තව දෙපාර්තමේන්තුව තුල පිහිටුවන ලද විශේෂ ඒකකය ක්‍රියාකාරී මට්ටමේ නොපවතින බව නිරීක්ෂණය විය. | මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වය යටතේ විශේෂ ඒකකයක් පිහිටුවා හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී මෙම ඒකකය සඳහා නව නිලධාරීන් පත්කර ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට දෙපාර්තමේන්තුව විසින් බදු දෙනු ලැබූ පේෂකර්ම බලවේග ව්‍යාපාර ආයතන 11න් 06 ක රු.16,148,250 ක හිඟ බදු පැවතුණි. බදු ගිවිසුම් යාවත්කාලීන කර බදු මුදල් අලුත් කිරීමට කටයුතු නොකිරීම, ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ අධීක්ෂණය නොකිරීම හා පසුවිපරම් කටයුතු සිදු නොකිරීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාදවීම මෙයට හේතුවී තිබුණි. කෙසේවෙතත් මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති උපදෙස් ඉල්ලා ඇත. | හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කල යුතුය. | නිරීක්ෂණ හා එකග වෙමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටුවා ඇති පේෂ කර්මාන්ත පුහුණු පාසල් 14 ක් හා ගැටඹේ හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසැල් මඟින් එක් අවුරුදු පුහුණු පාඨමාලා සඳහා සිසුන් 350 ක් බඳවා ගැනීමට පහසුකම් තිබෙන අතර සමාලෝචිත වර්ෂයේදී පුහුණු පාඨමාලාව සඳහා සිසුන් 175 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණි. වර්ෂයේදී සිසුන් 160 ක් පමණක් බඳවා ගෙන තිබුණු අතර එය බඳවා ගත හැකි සිසුන් සංඛ්‍යාවෙන් සියයට 45ක් පමණ විය. තවද පවත්වාගෙන යන පාඨමාලා අතරින් ජාතික වෘත්තීය සුදුසුකම (NVQ 3) සහතිකය ලබා දීමට සමත් වී තිබුණේ කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානයේ එක් පාඨමාලාවක් සඳහා පමණි. | සැළසුම් කල පරිදි පාඨමාලා පැවැත්විය යුතුය. | අධ්‍යාපන විද්‍යා පීඨවලට ඇතුලත් වීමේදී පේෂ කර්මාන්ත අවසාන සහතික පත්‍රයට යම්කිසි ලකුණු ප්‍රමාණයක් ලබා දුන්නත් පසුගිය වර්ෂයේ සිට එම ක්‍රමවේදය ඉවත් කිරීම සිසුන් පැමිණීම අඩු වීමට හේතු වී ඇති බව අනුමාන කල හැක. NVQ ලබා ගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

---------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක ස්වේච්ඡා වන්දි ක්‍රමය යටතේ වන්දි මුදල් ලබා දීමේදී වන්දි ලබා ගැනීමට ඉදිරිපත් නොවූ පාර්ශ්වයන් 63 දෙනෙකුට අදාල රු.4,549,169 ක් 2017 වර්ෂයේ සිට තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති අතර ඔවුන්ගේ හිමිකම සනාථකරගෙන අදාල මුදල් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | වන්දිලාභින්ගේ මුදල් අදාල පුද්ගලයන්ට ලබා දීමට හෝ හිමිකම් නොපෑ මුදල් රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කල යුතුය. | මේ සම්බන්ධව අමාත්‍යාංශ විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී ද සාකච්ඡා කල අතර එහි උපදෙස් අනුව කටයුතු කරන ලදී. ඒ අනුව 2020.06.30 දින පුවත්පත් දැන්වීමක් පල කල අතර දින 14 ක් ඇතුලත ඉදිරිපත් නොවන වන්දිලාභින්ගේ මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) 2017 වර්ෂයේදී ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් දීප ව්‍යාප්ත පේෂ කර්මාන්ත සංගණනය වෙනුවෙන් විස්තරාත්මක දත්ත රැස්කිරීම අදියර දෙකක් යටතේ ආරම්භ කරන ලදි. ජන ලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව හා පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා එක්ව සිදුකරනු ලැබූ මෙම සංගණනය සඳහා රු.මිලියන 16ක වියදමක් ඇස්තමේන්තු කර තිබූ අතර 2017 වර්ෂයේදී සංගණනය අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. 2018 වර්ෂයේ හා 2019 වර්ෂයේදී මෙම සංගණනයේ පළමු අදියර අවසන් කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. 6,133,535ක වියදමක් දරා තිබුණි. නමුත් 2020 අගෝස්තු 31 දින වන විටත් දෙවන අදියරෙහි කටයුතු අවසන් කර නොතිබුණි. | සංගණන කටයුතු ඇස්තමේන්තු කල පරිදි සිදුකර අවසන් කල යුතුය. | 2021 වර්ෂයේදී දෙවන අදියර සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර ප්‍රතිපාදන ලැබීමෙන් අනතුරුව එය අවසන් කිරීමට කටයුතු කරමි. |

**3.3 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කටුබැද්ද අංශයේ විදුලි පරිපථය ප්‍රතිස්ථාපනය සඳහා 2019 සැප්තැම්බර් 10 දින ලංසු කැඳවීමක් සිදුකර තිබුණි. මේ සඳහා ඇස්තමේන්තු පිරිවැය රු. 6, 938,940ක් වූ අතර රු 6,685,630ක් වූ මිලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2007 ඔක්තෝබර් 03 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 13ට අනුව රු. මිලියන 5 ඉක්මවන සෑම රජයේ කොන්ත්‍රාත්තුවක් සඳහා ඉදිරිපත්වන ලංසු කරුවන් විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත්කල යුතු අතර එසේ නොමැති ලංසුකරුවන් ඇඟයීමට කටයුතු නොකල යුතුයි. එසේම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම ලියාපදිංචි කල යුතුව තිබුණද දෙපාර්තමේන්තුව විසින් අදාල මාර්ගෝපදේශය පරිදි කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. | නිරීක්ෂණ හා එකඟ වෙමි. ඉදිරියේදී සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු වලදී මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසු නිළධාරියෙකු ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර තිබුණද, 2020 අගෝස්තු 31 වන විටත් එකී පුරප්පාඩුව එසේම පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුය. | එම පුරප්පාඩුව සඳහා නිළධාරියකු අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ද්විතීයික මට්ටමේ තනතුරු 33ක් පුරප්පාඩුව පවතින අතර ඉන් පුරප්පාඩු 13ක් තනතුර අහෝසි වීම නිසා පුරප්පාඩු වී තිබුණි. ඉතිරි පුරප්පාඩු 20 තුල සංවර්ධන සහකාර තනතුර හා තාක්ෂන නිලධාරී තනතුරු වල පුරප්පාඩු එක බැගින්ද, පුරප්පාඩු 5 ක් කළමනාකාර සහකාර තනතුරු වලද, පේෂකර්ම උපදේශක තනතුරු වල පුරප්පාඩු 13 බැගින්ද විය. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුයි. | කළමණාකරණ සේවා චක්‍ර ලේඛ 01/2020 මගින් නිළධාරීන් බඳවා ගැනීම තාවකාලිකව නවතා ඇති බව දැනුම්දුන් අතර පසුව මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ලබාගෙන බඳවාගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතී. |